**මඩකලපුව මහනගර සභාව**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**--------------------------------**

2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2015 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 01 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මඩකලපුව මහනගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2003 වර්ෂයේදී නැති වූ රු.6,860,650 ක වටිනාකමින් යුත් වතුර බවුසරය ලේඛනවලින් කපා හැරීමට කටයුතු නො කර වත්කම් වශයෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) 2014 වර්ෂයේ දී ආසියා පවුන්ඩේෂන් ආයතනයෙන් පරිත්‍යාගයක් වශයෙන් ලබා ගන්නා ලද පරිගණක යන්ත්‍ර 02 ක වටිනාකම තක්සේරු කොට ගිණුම්ගත කර නොතිබිණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු පළාත් පාලන සේවයේ සේවකයන් සඳහා වන විශ්‍රාම වැටුප්දායක මුදල් රු.28,354,199 ක් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී රු.80,500 කට මිලට ගත් විදුලි කියත සැපයුම්කරුට නැවත භාර දී ඊට අදාල මුදල ආපසු ලබා ගෙන ඇතත් ලබා ගත් මුදල් වත්කම් ගිණුමේ බැර කරනු වෙනුවට ආදායම් ගිණුමේ බැර කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

**-------------------**

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

**-----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.110,729,563 කි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.29,634,718 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.81,094,845 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 2.2 ආදායම් කළමනාකරණය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම්

මහ නගර සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම් විස්තර මෙහි පහත දැක්වේ.

| ආදායම් වර්ගය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) |
| වරිපනම් | 20,476,155 | 18,147,819 | 21,837,718 |
| දැන්වීම් ගාස්තු | 4,604,415 | 3,695,170 | 2,280,632 |
| වෙළෙඳ බලපත්‍ර | 8,910,877 | 9,377,067 | 2,893,052 |
| ගවඝාතකාගාර ගාස්තු | 34,939 | 40,987 | 17,174 |
| බදු කුලී | 8.212,817 | 4,593,802 | 10,395,219 |
| විනෝද බද්ද | 1,169,266 | 1,021,269 | 945,440 |
| නිවාස කුලී | - | 125,759 | 326,350 |
| බාහිර කඩ කුලිය | 2,229,400 | 2,301,452 | 1,015,974 |
| වෙළඳපොල කඩකුලිය | 3,231,550 | 3,011,985 | 971,795 |
| තානායම් කුලී ගාස්තු | 468,000 | 682,500 | 815,823 |

### 2.2.2 වරිපනම්

සමාලෝචිත වර්ෂය අවසානයේ දී අය කර ගත යුතු හිඟ වරිපනම් බදු රු. 21,837,718 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබිණ.

### 2.2.3 කුලී අයකරගැනීම්

කුලියට ලබා දී ඇති සභාව සතු තානායම් වෙනුවෙන් ශ්‍රී ලංකා යුද හමුදාවෙන් 1983 සිට 2015 දක්වා අය කර ගත යුතු රු.406,322ක මුදල් ද, නාගරික සංවර්ධන අධිකාරියෙන් 2013 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා අය කර ගත යුතු රු.156,000ක මුදල ද, සභාවට අයිති නිල නිවාසය ශ්‍රී ලංකා යුද හමුදාවට කුලියට ලබා දීම වෙනුවෙන් 2012 වසර දක්වා අය කර ගත යුතු රු.326 , 350 මුදල ද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අය කර ගෙන නොතිබුණි.

### 2.2.4 බදු ආදායම්

සභාවට අයිති කඩ බද්දට ලබා දීමේදී බදු ගැනුම් කරුවන් සමග ගිවිසගත් පරිදි සුරැකුම් ඇප හෝ බැංකු ඇපකර නොලබා බද්දට දීම නිසා 1990 සිට 2013 අවසානය දක්වා බදුකරුවන් 61ක් දෙනෙකුගෙන් අයකරගත යුතු හිඟ බදු රු. 6,492,873 ක මුදල අයකරගෙන නොතිබුණි.

### 2.2.5 විදුලි සංදේශ කුළුණු සඳහා අනුකූලතා සහතික ලබාදීම

2009 වර්ෂයේ අප්‍රේල් 17 වන දින අංක 1597/8 දරණ අති විශේෂ ගැසට් පත්‍ර දැන්වීම් පරිදි විදුලි

සංදේශ කුළුණු 07 ක් ස්ථාපනය කිරීම සඳහා අනුකූලතා සහතික ලබා නොගෙන මහනගර සභා සීමාව තුළ විදුලි සංදේශ කුළුණු පිහිටුවා ඇති නමුත් සභාව විසින් මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙවන සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘතියේ ( 2nd HSDP) අරමුදලින් 2014 දෙසැම්බර් 31 වන දින මහ නගර සභාව විසින් පුද්ගලික ආරෝග්‍ය ශාලාවල අපද්‍රව්‍ය පුළුස්සා දැමීම සඳහා මිළට ගන්නා ලද රු.2,624,800 ක් වටිනා Medical Waste Incinerator යන්ත්‍රය සුදුසු ස්ථානයක් තෝරා නොගැනීම හේතුවෙන් 2016 අප්‍රේල් 18 දින දක්වා භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) 2012 වර්ෂයෙන් පසු විශ්‍රම ලබා ගිය සේවකයන් 13 දෙනෙකුගෙන් රු. 548,503 ක හිග ණය මුදල් එම අයගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් හෝ අය කරගැනීමට මෙතෙක් ක්‍රියාකර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට සේවය අත්හිටුවන ලද සේවකයන් 9 දෙනෙකුගේ රු. 550,998 ක ණය හිග මුදල් ඔවුන්ගෙන් අයකර ගැනීමට හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් හෝ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයිති පර්චස් 84 ක පමණ වපසරිය ඇති රු.මිලියන 15ක් වටිනා ඉඩම් 5ක් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය නොකර සහ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තා ලබා නොගෙන 2011 සහ 2012 වර්ෂවලදී නගරාධිපතිවරයා විසින් බද්දට ලබාදී තිබුණි.

(ආ) මහනගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි පුද්ගලික ඉඩමක් කොටස්වලට බෙදා විකිණීමේ දී ඉන් නියමිත කොටසක් සහ නගර සභාවේ පොදු පහසුකම් සඳහා පවරා දිය යුතුය. මෙලෙස මහ නගර සභාවට පවරා දුන් පර්චස් 97 ක පමණ වූ වටිනා ඉඩම් 5 ක් කලින් සිටි කොමසාරිස් විසින් තම බිරිඳගේ නමට ද තමාගේ නමට 2003 සිට 2006 කාලය තුළ ලියා පවරාගෙන තිබුණි. මෙම කරුණ මාගේ පෙර වර්ෂයේ වාර්තාවේ ද සඳහන් කර තිබූ නමුත් මේ සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු ක්‍රියා මාර්ගයන් ගෙන නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

**ග්‍රීන් බෙල්ට් ව්‍යාපෘතිය**

------------------------

මහ නගර සභා සීමා බල ප්‍රදේශය තුල පිහිටි කල්ලඩි, තිරුච්චේන්දූර් මුහුදු වෙරළ පෙදෙසෙහි යූඑන්හැබිටාට් (UNHABITAT) ආයතනයේ මූල්‍යමය ආධාරය යටතේ 2013 සහ 2014 යන වර්ෂවල රු.3,279,886 ක් වැයකොට ගස් 600 ක් හා පැළ 2,400 ක් සිටුවා මහ නගර සභාවට භාර දී තිබුණි. නමුත් පැළ සිටුවන ලද එම ස්ථානයේ දැනට ඉතිරිව ඇත්තේ ගස් 157 ක් පමණකි. එමනිසා ආදාල ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත බලාපොරොත්තු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.4 ඝණ අපද්‍රව්‍ය එකතු කිරීම් කළමණාකරණය

-----------------------------------------------

2006 වර්ෂයේ නෙක්ඩෙප් ආයතන විසින් රු.මිලියන 100 ක පමණ පිරිවැය දරා තිරුප්පෙරුම්තුරෙයි යන ස්ථානයේ පිහිටුවන ලද ඝණ අපද්‍රව්‍ය එකතු කිරීම් මධ්‍යස්ථානය විද්‍යාත්මක වශයෙන් ද්‍රව්‍ය බැහැර කිරීමේ ආයතනයක් වශයෙන් වෙනස් කිරීම් කළ නමුත් 1980 අංක 47 දරන ජාතික පරිසර පනත අනුව පාරිසරික ආරක්ෂණ සහතිකයක් ද ලබා ගෙන නොතිබූ අතර ශක්‍යතා අධ්‍යයනයක් නොකර මහජනතාව වාසය කරන ස්ථානයට යාබදව නිර්මාණය කර තිබූ බැවින් මෙම පෙදෙසේ මහජනතාවට විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවී ඇති බැවින් රෝග බෝවීමේ අන්තරාකාරි තත්ත්වයක් උදා වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

## 4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------------

2016 මාර්තු 24 දින අංක 128 දරන ජාතික අය වැය චක්‍රලේඛය අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබිණි.

## 4.2 අය වැය පාලනය

-------------------

අය වැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 0.2% සිට 90% දක්වා විචලනයක් නිරීක්ෂණය වූ හෙයින් අයවැය කළමනාකරණයෙහි කාර්යක්ෂම ඵලදායි පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ආදායම් කළමනාකරණය

(ආ) අය වැය පාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය